# තලෙන්ත උපමාව

-The Parable of the Talents-



62Page

**පොතේ ගුරා** බොහෝ කාලයකට පෙර සිටි එක් මිනිසෙක් දුර පලාතකට ගමනක් යාමට තීරණයක් ගත්තා. ඔහු ගමන් යන්නට පළමුවෙන් තමාගේ සේවකයන් 3 දෙනෙකුට කතා කරමින් තමුන්ගේ දේපල බෙදාදීමක් කළා.

**ස්වාමියා** මම ඔයාලා හැමකෙනෙක්ටම මගේ දේපලවලින් කොටසක් දෙනවා. මම නැති කාලයේදී ඔයාලා මේ දේපල සමග ගණුදෙනු කරමින් ආයෝජනය කරන්න.

**පොතේ ගුරා** එක් සේවකයෙකුට ස්වාමියා විසින් තලෙන්ත 5ක්ද, දෙවැන්නාට තලෙන්ත 2ක්ද, අනෙක් සේවකයාට තලෙන්ත 1ක්ද බැගින් දුන්නේය.

**ස්වාමියා** ඔන්න, මම මේ තලෙන්ත ඔබට දුන්නේ ඔබේ දීමනාවන් හා ශක්තීන් පදනම් කරගෙනයි. දැන් ඔබලා ගොස් ඔබේ උපරිමයෙන් මා කී දේ කරන්න.

**පොතේ ගුරා** ස්වාමියා ඔහුගේ සේවකයන්ට ආයුබොවන් කියා ඔහුගේ ගමන යන්න පිටත් වුණා.

---



63Page

**පොතේ ගුරා** ස්වාමියා පිටත්ව ගියාට පසු, පළමු සහ දෙවන සේවකයන් ඔවුන්ට දුන්නාවූ දේපල (මුදල්) ස්වකීය වැඩයන්හි යෙදෙව්වා. ඔවුන් දෙදෙනාගේම විශ්වාසය වූයේ ඔවුන් උපරිමයෙන් මහන්සිවෙලා වැඩ කළොත් තමුන්ගේ ස්වාමියා සතුටුවන බවයි. පළමු සේවකයා විසින් ලබා ගත් තලෙන්ත 5 එවලෙහිම ගොස් කුඹුරක වැඩෙහි යෙදෙව්වා. ඔහු ගොඩක් මහන්සි වෙලා වැඩ කළා. දෙවන සේවකයත් එසේම ගොඩක් මහන්සියෙන් වැඩ කළා. පළමු දවස, දෙවන දවස, පළමු මාසය, දෙවන මාසය, කාලය ගතවීගෙන යත්ම ඔවුන් මහන්සියෙන් කළ වැඩෙහි ප්‍රතිඵල ලැබුවා. තලෙන්ත 5ක් ලැබූ පළමු සේවකයා ඉන් තවත් 5ක් උපයා ගත්තා. තලෙන්ත 2ක් ලැබූ දෙවන සේවකයාත් ඉන් තවත් දෙකක් උපයා ගත්තා. එතකොට තුන්වැන්නාට මොකද වුණේ ?

---



64Page

**පොතේ ගුරා** මාස කිහිපයකට පසුව, ස්වාමියා තමාගේ දීර්ඝ සංචාරයෙන් පසු නැවත නිවසට පැමිණෙනවා. සේවකයන් තිදෙනාම ස්වාමියා ඉදිරියට පැමිණ, ඔහු නොසිටියාවූ කාලයේ සිදුවුණාවූ දේවල් කියන්නට වුණා. මුලින්ම තමුන්ට දුන් තලෙන්ත 5 දෙගුණයක් කරගත් පළමු සේවකයා අමතා ස්වාමියා මෙසේ කීවා,

**ස්වාමියා** ඉතා හොඳයි, යහපත් විශ්වාසවන්ත දාසය, නුඹ කුඩා දේ කෙරෙහි විශ්වාස කළ නිසා මහත් දේ කෙරෙහි අධිපතිකම් කරන්නට මම නුඹව පත් කරමි, එන්න... ඇවිත් ස්වාමියාගේ ප්‍රීතියට ඇතුල්වන්න.

**පොතේ ගුරා** ස්වාමියා විසින් දෙවන සේවකයාටත් එම ඇගයීමම කළා.

www.kidworship.kr



65Page

| | |
|---|---|
| ස්වාමියා | ඉතා හොඳයි, යහපත් විශ්වාසවන්ත දාසය, නුඹ කුඩා දේ කෙරෙහි විශ්වාස කළ නිසා මහත් දේ කෙරෙහි අධිපතිකම් කරන්නට මම නුඹව පත් කරමි, එන්න... ඇවිත් ස්වාමියාගේ ප්‍රීතියට ඇතුල්වන්න. |
| පොතේ ගුරා | මේ ස්වාමියා පළමු, දෙවන සේවකයන්ගේ ජයග්‍රහණයන් දැක ප්‍රීතිමත් වුණා. එසේම ඔවුන්, තවත් බොහෝ දේ කෙරේ අධිපතිකම් කරන්නන් බවට පත්කරන්නටත්, ස්වාමියා පොරොන්දු වෙනවා. |
| පොතේ ගුරා | අන්තිමට තුන්වන සේවකයා ඇවිත් මෙසේ කතා කරනවා. |
| තුන්වන දාසයා | ස්වාමිනි, ඔබ නොවපුළ තැනින් කපාගන්න, නොඉස්ස තැනින් රැස්කරගන්න කර්කස මනුෂ්‍යයෙකු බව මම දන්නවා. ඒ නිසා මම ඔබට භයවී ගොස් තලෙන්තය පොළොව යට සඟවා තැබුවා. මෙන්න ඔබ සන්තක දේ ... |
| පොතේ ගුරා | මේ දේ නිසා ස්වාමියාට හොඳටම කේන්තිය ආවා. |
| ස්වාමියා | මොකක් ? ඔබ නපුරෙක්.. අලස දාසයෙක් ! ඔබ දැනගෙන සිටියා නම් මං කර්කස මනුෂ්‍යයෙක් කියලා, එහෙමනම් ඔබ මගේ මුදල් බැංකුවේ හරි තැන්පත් කරන්නයි තිබුණේ. අඩු තරමේ මම ඒකේ පොළිය හරි ගන්නවා. ඔබගේ මේ එක් තලෙන්තය මම අරගෙන තලෙන්ත දහයක් ඇත්තාට දෙනවා. මේ නිෂ්ප්‍රයෝජන දාසයා පිටත අන්ධකාරයේ දමන්න. |

........................................................................................................



66Page

| | |
|---|---|
| පොතේ ගුරා | තමතමුන්ගේ දීමනාවන් භාවිතා කරමින් මහන්සි වී වැඩකළ සේවකයන්, ස්වාමියාගේ ප්‍රීතියට ඇතුල්වුණා. නමුත් කම්මැලි-අලස උත්සහයක් නොගත් සේවකයා හඬද්දීම පිටතට දමනු ලැබුවා. |
| ජීවිතයට අදාල කිරිම | දුවේ,පුතේ, දෙවිපියාණන්වහන්සේ ඔයාට දීලා තියෙන දේපල මොනවද? බුද්ධිය, අධ්‍යාපනය, හැකියාවන්, දක්ෂතාවයන් වැනි දේවල්. මේ දවස්වල ඔයා උපරිමයෙන් මහන්සිවෙලා මේවගෙන් ප්‍රයෝජන ගන්නවාද? එහෙනම් දෙවිපියාණන් බොහොම ප්‍රීතිවෙයි. උන්වහන්සේ තවත් බොහෝ දේවල් ඔබට භාරදෙන්න කැමතිවෙයි. |